# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2448/20 – 2025 අගෝස්තු මස 05 වැනි අඟහරුවාදා – 2025.08.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2023/234.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ලංකා වෙළෙඳ කාර්මික සහ පොදු කම්කරු සංගමය (සීඑම්යූ), අංක 03, බාලා තම්පෝ පටුමඟ, කොළඹ 03.

සහ

සී/ස ෂෝ ටු ෂෝ පුද්ගලික සමාගම, වටරවුම් පාර 01, අපනයන සැකසුම් කලාපය (EPZ), කටුනායක.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, සීදූව, ලියනගේමුල්ල, එච්. පී. ටී. ප්‍රධාන පාර, 31/1, නීතිඥ සී. ඒ. එච්. එම්. විජේරත්න මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජූලි මස 31 වැනි දින,
කොළඹ දී ය.

1A – G 045058 – 14 (2025/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/2023/234.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ලංකා වෙළෙඳ කාර්මික සහ පොදු කම්කරු සංගමය (සීඑම්යූ), අංක 03, බාලා තම්පෝ පටුමඟ, කොළඹ 03.

සහ

සී/ස ෂෝ ටු ෂෝ පුද්ගලික සමාගම, වටරවුම් පාර 01, අපනයන සැකසුම් කලාපය (EPZ), කටුනායක.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

"සී/ස ෂෝ ටු ෂෝ සමාගමේ සේවය කරන එස්. ජී. සමන්ත හෙලකුමාර මහතාට මාසිකව ගෙවනු ලැබූ රු. 5000.00 ක අමතර දීමනාව 2022 පෙබරවාරි මාසයේ සිට අහිමිකිරීම මගින් ඔහුට අසාධාරණයක් සිදුවී තිබේ ද, යන්නත් එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ."

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජූලි මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 08 – 0056

---

මගේ අංකය: IR/COM/02/2023/130.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ටී. ඒ. රොෂාන් අෂ්රෆ් මයා, 21/6, බදුල්ල පාර, හාලිඇල.

සහ

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ගාල්ල, කිතුලම්පිටිය, වේවැල්වල පාර, 10/51, වසන්ත වික්‍රමරත්න පුංචිහේවා මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජූලි මස 31 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2023/130.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ටී. ඒ. රොෂාන් අෂ්රෆ් මයා, 21/6, බදුල්ල පාර, හාලිඇල.

සහ

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

"ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ S-IV ශ්‍රේණියේ පොදු සහකාර තනතුරෙහි සේවය කරමින් සිට 2019.01.10 දින සිට වැඩ තහනමට ලක්වූ ටී. ඒ. රොෂාන් අෂ්රෆ් මහතාට එරෙහිව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් පවත්වනු ලැබූ විධිමත් විනය පරීක්ෂණය අනුව ලබාදුන් විනය නියෝගයේ දඬුවම් හේතුවෙන් ඔහුට අසාධාරණයක් සිදුව තිබේද, යන්නත් එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ."

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජුලි මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 08 – 0057

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.